# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/43/2025 (PSC)

වෛද්‍ය උපුල් සුරේන්ද්‍ර හැදලගේ,

**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.02.19**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් නීතිඥ ශ්‍යාමල් ඒ.කොල්ලුරේ මහතා සමඟ නීතිඥ ප්‍රභාත් අමරසිංහ මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ආර්.එම්.පී.ඒ.බණ්ඩාර මහතා.

## -<u>නියෝගය</u>-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

වෛද්‍ය උපුල් සුරේන්ද්‍ර හැදලගේ යන අය විසින්, 2025.02.24 දිනැතිව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, පැ.24 ලෙස අභියාචනා පෙත්සම සමඟ ඉදිරිපත් කර ඇති විනය නියෝගය අවලංගු කර, ප්‍රත්‍යාදිශ්ඨ කර දෙන ලෙසයි. ඒ සමඟම එම නියෝගයේ දැක්වෙන, අභියාචක වෙත නිකුත් කර ඇති දඬුවම ද ඉවත් කරන ලෙස ඉල්ලා ඇත. ඉහතකී දඬුවම අභියාචක වෙත නිකුත් කර ඇත්තේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනා දෙකක් සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේදී, එම චෝදනා වලට අභියාචක වරදකරු කිරීම හේතුවෙනි.

අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ ප්‍රථම චෝදනාව වන්නේ, ඔහු වෙත ප්‍රතිකාර සඳහා පැමිණි පාසල් දැරියකගේ හා වෙනත් අයගේ අශ්ශීල දර්ශන ඇතුළත් ඡායාරූප සහ වීඩියෝ දර්ශන ලබා ගැනීම හා/හෝ එකී දර්ශන ඔහුගේ සන්තකයේ තබා ගැනීමෙන්, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ පළමු

වන උපලේඛනයේ, අංක 10 හි සඳහන් වරද සිදුකර තිබීමයි. දෙවෙනි චෝදනාව ලෙසට ඉදිරිපත් කර ඇත්තේ, පළවන චෝදනාව ඔප්පු වීම මතය. ඒ අනුව මෙහිදී තීරණය කළ යුතු කරුණ වන්නේ, පාසල් දැරියකගේ හෝ වෙනත් අයෙකුගේ අශ්ශීල දර්ශන ඇතුළත් ඡායාරූප හෝ වීඩියෝ දර්ශන පට, අභියාචකගේ සන්තකයේ තිබුණාද යන්නයි.

මෙම කරුණ සනාථ කිරීම සඳහා විධිමත් විනය පරීක්ෂණයේ දි ඉදිරිපත් ව තිබූ සාක්ෂි සළකා බලන ලදි. විධිමත් විනය පරීක්ෂණයේ දී කාන්තා නියෝජ්‍ය පොලිස්පති බිම්ෂානි ජාසිංහආරච්චි යන නිලධාරිනිය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඇය විසින් පාසල් දැරියක වන ඉදුනිල් ප්‍රියංගිකා යන අයගේ ප්‍රකාශයක් සටහන් කර ගත් බවයි. පසුව මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා, අභියාචක පොලිස් අත් අඩංගුවට ගත් බවත් ඇය ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේ දී අභියාචක භාරයේ තිබූ, මෙම සිද්ධියට උපයෝගී කර ගන්නා ලද C.P.U යන්ත්‍රයක්, ජංගම දුරකතනයක්, ලැප්ටොප් පරිගණකයක්, හා සිම්කාඩ්පත නඩු භාණ්ඩ ලෙස ලබාගත් බවටත් ඇය සාක්ෂි දී ඇත.

ඉන් අනතුරුව සාක්ෂි දුන් චතුර ප්‍රසාන් සුදුවැල්ල යන අය ප්‍රකාශ කර ඇත්තේ, ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලේ විද්‍යාත්මක සහකාර ලෙස සේවය කරන බවයි. ඔහු සේවය කරන ස්ථානයේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කල මහාචාර්ය ගිහාන් වික්‍රමනායක විසින් නිකුත් කරන ලද වාර්තාවක් සම්බන්ධයෙන් ඔහු සාක්ෂි දී ඇත. ඒ අනුව ඔහු ප්‍රකාශ කර ඇත්තේ, මහාචාර්ය ගිහාන් වික්‍රමානයක මහතාගේ අත්සන් ඔහු හඳුනන බවයි. මෙම නඩුවට අදාළ ව ඉදිරිපත් කරන ලද ලේඛනයේ ඇති අත්සන සාක්ෂිකරුට පෙන්වා දීමෙන් පසුව, එම වාර්තාවේ ඇති අත්සන මහාචාර්ය ගිහාන් වික්‍රමනායකගේ බවට හඳුනාගෙන ඇත. එම වාර්තාව පැ.5 ලෙසට ලකුණු කර ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව අදාළ පරිගණකය තුල තිබූ ඡායාරූප හා වීඩියෝ දර්ශන සොයාගත් බවට ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එම වාර්තාවේ අන්තිම ඡේදයේ මෙසේ සඳහන් වේ.

> "***2:1*** ***මෙම 2GB ධාරිතාවක් සහිත Mini SD වර්ගයේ බාහිර මතකපත පරීක්ෂා කර බලන ලදි. මෙම බාහිර මතක පත තුළ තිබී ඡායරූප සහ වීඩියෝ දර්ශන සොයා ගන්නා ලදි. එම ඡායාරූප සහ වීඩියෝ දර්ශන පිළිබඳ විස්තර පහත දක්වේ.***
>
> ***2.1.1*** ***ඡායරූප (Photos)*** - ***136***
>
> ***2.1.2*** ***වීඩියෝ දර්ශන (Videos)*** - ***11***
>
> ***මෙම 2.1.1 හි අන්තරගත ඡායාරූප වල මෘදු පිටපත් සංයුක්ත තැටියක් තුළ INT__Photos__01 යන ෆෝල්ඩරය තුළ අන්තරගත කරන ලදි.***

***මෙම 2.1.2 හි අන්තර්ගත වීඩියෝ දර්ශන වල මෘදු පිටපත් සංයුක්ත තැටියක් තුළ INT __Photos _01 යන ෆෝල්ඩරය තුළ අන්තරගත කරන ලදි.***

***එම සංයුක්ත තැටිය B3399-CD-01 ලෙස නම් කරන ලදි.***

***2:2 මෙම බාහිර මතක පත තවදුරටත් පරීක්‍ෂා කිරීමේ දී එහි දත්තයන් මකා දමා ඇති බව තහවුරු කර ගන්නා ලදි. තාක්‍ෂණික උපක්‍රම භාවිතයෙන් මෙම බාහිර මතක පත තුළ තිබී මකා දමන ලද දත්ත අනාවරණය කර ගන්නා ලදි.***"

ඉහත සාක්ෂිය බිඳ හෙළීමට සමත් වී නැත. ඒ අනුව එම සාක්ෂි පිළිගනිමින් කටයුතු කිරීමෙහි දෝෂයක් පෙනෙන්නට නැත.

කෙසේ වෙතත් මෙම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණය පවත්වන ලද පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාව කෙරෙහිද අවධානය යොමු කරන ලදි. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඉදිරියේ ලබාදී ඇති සාක්ෂි විශ්ලේෂණය කිරීමට ඇති හොඳම පුද්ගලයා එකී පරීක්ෂණය පැවැත්වූ නිලධාරියායි. සාක්ෂිකරුවන් ඔහු ඉදිරියේ සාක්ෂි දුන් විලාසය සම්බන්ධයෙන් ඔහුට අවබෝධයක් තිබී ඇත. ඒ අනුව, පරීක්ෂණ නිලධාරියා විසින් අභියාචක වරදකරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති හේතූන් වැදගත් වනවා ඇත. ඔහුගේ වාර්තාවේ 3:2 අනු ඡේදයේ මෙසේ සඳහන් වේ.

*"3:2 **මෙම දෘඩ තැටියේ සමහර දත්තයන් මකා දමා තිබි ඇති අතර ඒවා ප්‍රතිස්ථාපනය කර පරීක්‍ෂා කිරීමේ දී ඡායාරූප 8991 ද, වීඩියෝ දර්ශන 315ක් ද තිබී ඇත. ඡායාරූප පරීක්‍ෂා කිරීමේ දී නිරුවත් කාන්තාවන්ගේ සහ නිරුවත් පිරිමින්ගේ ඡායාරූප ද, නිරුවත් කාන්තාවන්ගේ සහ නිරුවත් පිරිමින්ගේ ලිංගික ක්‍රියාකාරකම් සහිත ඡායරූප ද තිබී ඇති බව වාර්තාවේ සඳහන් වේ.***

***මෙම අන්තර්ගත ඡායාරූප වල මෘදු පිටපත් DVD තැටියත් තුළද, වීඩියෝ දර්ශන වල මෘදු පිටපත් ද DVD තැටියක අන්තර්ගත කර එම DVD තැටිය B3399-DVD-04 ලෙස නම්කර ඇති බව සඳහන් වේ."***

ඉහත සඳහන් විද්‍යාත්මක සාක්ෂි නොපිළිගැනීමට හේතුවක් නැත. එම සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ජංගම දුරකථනය, ලැප්ටොප් පරිගණකය, සිම් කාඩ්පත, C.P.U යන්ත්‍රය යනාදි උපකරණ, අභියාචක භාරයේ තිබී ලබා ගත් බවටද පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වේ. එම භාණ්ඩ අභියාචකගේ නොවන බවට අභියාචක විසින් කරුණු ඉදිරිපත් කර නැත. එසේ නම් එම සාක්ෂි වල ඇතුළත් කරුණු පිළිගනිමින්, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් ගෙන ඇති තීරණයෙහි දෝෂයක් පෙනෙන්නට නැත.

ඉහත හේතුන් අනුව පෙනී යන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා ඔප්පු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී ඇති බවයි. ඒ අනුව ඉදිරිපත් කර ඇති චෝදනා වලට අභියාචක වරදකරු කිරීමේ දෝෂයක් පෙනෙන්නට නොමැති බැවින්, එම තීරණය වෙනස් කිරීමට මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත.

එකී චෝදනා සම්බන්ධයෙන් වරදකරු බවට පත්කිරීමෙන් අනතුරුව, අභියාචක වෙත පනවා ඇති විනය නියෝගය සම්බන්ධයෙන් ද විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. අභියාචක රජයේ වැදගත් සහ ඉහළ තනතුරක් දරණ පුද්ගලයෙකු වන හෙයින් සහ ඔහු වරදකරු බවට පත්කර ඇති චෝදනාවේ ස්වභාවය සළකා බැලීමේ දී, එය රජයේ සේවකයෙකු විසින් නොකළ යුතු කාර්යයක් බව පෙනී යයි.

එම තත්ත්වය යටතේ අභියාචක වෙත පනවා ඇති දඬුවම සම්බන්ධයෙන් මැදිහත් වීමටද මෙම විනිශ්චය අධිකාරය කටයුතු නොකිරීමට තීරණය කරමු.

ඉහත හේතුන් සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-